**නැගෙනහිර පළාත් සභාව - 2022 වර්ෂය**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 සැප්තැම්බර් 15 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2 ) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලට අදාල මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම රු.578,303,671 ක් ලෙස දක්වා තිබුණද, 2022 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගිණුම් පොත්වල එම ආදායම රු.576,933,764 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් අරමුදලට අදාල මූල්‍ය ප්‍රකාශනවල එම ආදායම රු.1,369,907 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වෙනසට හේතුව ලෙස සංඛ්‍යාලේඛන අත්පොත අනුව 2021 දෙසැම්බර් 31 දෛනික එකතුව 2021 හි ආදායමක් ලෙස සැලකුවද, සමහර අංශවල 2021 දෙසැම්බර් 31 වැනි දින දෛනික එකතුව 2022 ජනවාරි 1 වැනි දින ආදායම ලෙස ගිණුම්ගත කර තිබීම. | අදාල ආයතනවල ආදායම් ලේඛන අනුව වර්ෂය සඳහා ආදායම් හඳුනාගැනීම තහවුරු කරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් පළාත් විශේෂ සංවර්ධන ප්‍රදාන ලෙස රු.20,613,654 ක් පළාත් සංචාරක කාර්යාංශයට සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට ලබා දී තිබුණි. එම ආයතන විසින් රු.915,654 ක් පුනරාවර්තන වියදම් සඳහා දරා තිබුණද ඒවා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස අරමුදල් ගිණුමේ දක්වා තිබුණි. | නිරීක්ෂණ සමඟ එකග වෙමි. | PSGD අරමුදල් නියමිත අරමුණ සඳහා යොදාගතයුතු අතර මෙම අරමුදල් පුනරාවතන වියදම් සඳහා යොදා ගත නොහැකි වේ. |
| (ඇ) පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අයත් රු.20,940,000 ක් වටිනා වාහන පහක (05) අගය රු.13,350,000 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගෙනවිත් තිබුණි. එබැවින්, එම දෙපාර්තමේන්තුවේ හා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් රු.7,590,000කින් අඩුවෙන් දක්වා තිබුණි. | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ වාහන 8 ක් තිබේ. වාහන 5 ක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අගය කර ඇත. වාහන 03 ක වටිනාකම තක්සේරු කිරීමට පියවර ගෙන ඇත. | මුදල් වර්ෂය අවසානයේදී මූල්‍ය නොවන වත්කම් වල නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශන තුළින් නිරූපණය කලයුතුය. |
| (ඈ) 2021 දෙසැම්බර් 31 දිනට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ, මූල්‍ය නොවන වත්කම් යටතේ රු.1,035,651,703 ක නොනිමි වැඩ ශේෂයක් පෙන්වා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ එම අගය ප්‍රාග්ධනිත කර හෝ මූල්‍ය නොවන වත්කම් සඳහා සිදු කරන ලද වෙනස්කම් යටතට ගෙන නොතිබූ හෙයින්, නොනිමි වැඩවල ආරම්භක ශේෂය පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනයේ සහ මෙම දෙපාර්තමේන්තවේ මූල්‍ය ප්‍රකාශනවල එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ආරම්භක ශේෂයන් ඉදිරි වර්ෂය සඳහා ගෙන එමේදී ඒවා නිවැරදිව සත්‍යාපනය කලයුතුය. |
| (ඉ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරිපාලන අංශය විසින් විගණනය සඳහා ඉදිරිපත් කර ඇති වාහන ලැයිස්තුවට අනුව එම වාහනවල මුළු වටිනාකම රු.38,792,400 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත් දෙපාර්තමේන්තුවේ සහ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව මෙම අගය රු.24,415,000 ක් ලෙස දක්වා තිබීමෙන්, මෙම අගයන් දෙක අතර රු.14,377,400 ක වෙනසක් දක්නට ලැබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය ප්‍රකශනවල සත්‍ය හා සාධාරණත්වයක් නිරූපණය කිරීම සඳහා වාහනවල අගය නිවැරදිව ගිණුම්ගතකල යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) පළාත් සභාවේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දැක්වෙන හා පළාත් සභාවට අයත් එක් එක් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව විගණනයේ දී ගණනය කරන ලද පුනරාවර්තන වියදම් අයිතම 03 ක් සහ මුළු ප්‍රාග්ධන වියදම් අතර පිළිවෙළින් රු.1,781,626 ක සහ රු.92,661,000 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | පළාත් භාණ්ඩාගාරයේ සෑම වියදම් ශීර්ෂයක්ම ඒකාබද්ධ කර සකස් කර ඇති මාසික ගිණුම් සාරාංශ අනුව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් පුනරාවර්තන සහ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වන වියදම් නිවැරදි වේ. | විචලතාවයන්ට හේතුන් හඳුනාගෙන ඒවා නිවැරදි කල යුතුය. |
| (උ) පළාත් සභාවේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්වෙන පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම්, මධ්‍යම රජයේ 321 ශීර්ෂය යටතේ වාර්තා කර ඇති වියදම් හා සැසඳීමේදී පිළිවෙලින් රු.මිලියන 34,301.11 ක සහ රු.මිලියන 31,614.59 ක පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දක්වා ඇත. | පිළිතුරු ලබා දී නොමැත. | විචලතාවයන්ට හේතුන් හඳුනාගෙන ඒවා නිවැරදි කල යුතුය. |

| විස්තරය | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දැක්වෙන වටිනාකම | ශීර්ෂය 321 යටතේ දැක්වෙන වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පුනරාවර්තන වියදම් | 32,666.38 | □29,963.79 | 2,702.59 |
| ප්‍රාග්ධන වියදම් | 1,634.73 | 1□650.80 | (16.07) |
| මුළු වියදම් | 34,301.11 | 31,614.59 | 2,686.52 |

| | | |
|---|---|---|
| (ඌ) ඉඩමේ අයිතිය ලබා නොගෙන ප්‍රධාන ලේකම් නිල නිවාසයේ සහ ඉඩමේ වටිනාකම රු.20,800,368ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වැය විෂය අංක 6111107 යටතේ 2022 මූල්‍ය ප්‍රකාශනවලට අනුව සඳහන් වන්නේ ප්‍රධාන ලේකම් නිල නිවාසයේ ගොඩනැඟිලි අගය වන රු.20,800,368, පමණක් වන අතර අපගේ මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් වටිනාකම ඇතුළත් කර නොමැති අතර, එයට හේතුව වන්නේ ඉඩම් හිමිකම "දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය" යන නමින් පැවතීමයි.<br>කෙසේ වෙතත්, "ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, නැගෙනහිර පළාත" යන නාමයට හිමිකාරිත්වය පැවරීමට අප කටයුතු කර ඇති අතර 2023 මූල්‍ය ප්‍රකාශනයෙන් අන්තර්ග්‍රහණය කළ යුතු ක්‍රියාමාර්ග ද ආරම්භ කර ඇති බව දන්වා සිටිමි. | නිල නිවස පිහිටි ඉඩමේ අයිතිය ලබාගැනීමට කටයුතු කලයුතු අතර ඒවායේ වර්තමාන වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | එකතුව රු.1,484,819,222 ක් වූ වත්කම් අයිතම හතරකට අදාල විස්තරාත්මක උපලේඛන, තක්සේරු වාර්තාව සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වැනි ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණු අතර දිස්ත්‍රික් කාර්යාල තුනක් ඇතුළුව මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් අධ්‍යක්ෂ විසින් ගෙවන ලද එකතු කළ අගය මත බදු වලට අදාල බදු ඉන්වොයිසිය හා ලදුපත් ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | (i)-(iv) ACA-06 පෝරමය හරහා මූල්‍ය ප්‍රකාශන පෙන්වා ඇති සියලුම වත්කම් 2022 සමීක්ෂණ මණ්ඩල වාර්තාවට ඇතුළත් කර ඇත. වත්කම්වල වටිනාකම ඇතුළත් කිරීමට සමීක්ෂණ වාර්තාවේ ප්‍රතිපාදන හෝ ඉඩක් වෙන් කර නොතිබුණි. වර්තමානයේදී DCS (මූල්‍ය) විසින් වත්කම් කළමනාකරණ පද්ධති (AMS) මෘදුකාංගය හරහා අපගේ පොත්වලට අනුව අයත්වන සියලුම වත්කම් අගය කිරීමට සහ ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. එබැවින් ඉදිරියේදී සියලු වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. | මූල්‍ය ප්‍රකාශන වලට වත්කම් වල අගයන් ඇතුලත් කිරීමේදී ඒ සඳහා වු මූලාශ්‍ර ලේඛන තොරතුරු තහවුරු කරගත යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්බව අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය - 910 ප්‍රධාන අමාත්‍ය කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාවට පරිබාහිරව තොරතුරු තාක්ෂණ සහකාරවරයෙකු සහ පරිවර්තකයෙකු අතිරේකව බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ඔවුන්ට දීමනා වශයෙන් රු.10,771,404ක් ගෙවා තිබුණි. තවද, අනුමත සේවක සංඛ්‍යාවට අමතරව සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු අතිරේක ලෙස යොදවා තිබූ අතර රු.1,121,470 ක මුදලක් වැටුප් වශයෙන් ඔවුන් වෙත ගෙවා තිබුණි. | නැගෙනහිර පළාත සඳහා අනුමත සේවක සංඛ්‍යාව සැලකීමේදී, විශේෂයෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාරවරයෙකු සහ පරිවර්තක සේවක සංඛ්‍යාව යොමු කිරීම සම්බන්ධයෙන්, ඔවුන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් පිරිස් හා පුහුණු කාර්යාලයට සහ ප්‍රධාන ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇත. පසුව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්ය මණ්ඩල සහ පුහුණු කායීලය විසින් මෙම කාර්ය මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ සේවය අවශ්‍ය සුදුසු ස්ථාන වෙත වගකීමෙන් යුතුව යොදවා ඇත. මෙම අනුයුක්ත කිරීමේ ප්‍රතිපලයක් වශයෙන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාරවරයෙකු සහ පරිවර්තකයෙකු අප අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇති අතර, ඔවුන්ට | සේවක සංඛ්‍යාව අනුමත කරගැනීම සඳහා අවශ්‍ය තොරතුරු කලමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඒ සඳහා අනුමැතිය ලබාගෙන සේවකයින් බඳවා ගැනීමට කටයුතු කලයුතුය. |

| | | |
|---|---|---|
| | පැවරී ඇති කාර්ය භාරය මත ඔවුන්ගේ වැටුප් නියමිත පරිදි මෙම අමාත්‍යාංශයෙන් ගෙවනු ලැබේ. | |

### 1.5.2 ශීර්ෂය - 912 ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රැකියා විරහිත තරුණ තරුණියන් 995 දෙනෙකුට රෙදි විවීම, කොහු, වඩු කර්මාන්තය, මැටි භාණ්ඩ, සම් භාණ්ඩ, විදුලි කාර්මික ශිල්පය, බතික් සහ ඇඳුම් මැසීම යන කටයුතු පුහුණු කිරීමට දෙපාර්තමේන්තුවට අවස්ථාව තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ පුහුණු වැඩසටහන සඳහා අභ්‍යාසලාභීන් 358 දෙනෙකු පමණක් ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් තෝරාගෙන තිබුණි. ඒ අතරින් පුහුණුලාභීන් 201ක් පාඨමාලාව සම්පූර්ණ කර ඇති අතර, සියයට 43ක් එනම් 157 ක් අභ්‍යාසලාභීන් පාඨමාලා හැර ගොස් තිබුණි. | ග්‍රාමීය ප්‍රදේශවලින් විවිධ සමාජවලින් පැමිණෙන පුහුණුවන්නන් ඇත. අපි ඔවුන් සඳහා අඛණ්ඩව පුහුණුව ලබා දුන්නද අද තරුණ තරුණියන් පුහුණුවීම්වලින් ඉවත් වන්නේ තමන්ගේ පෞද්ගලික මනාපයන් සහ දේශීය නිෂ්පාදන ඉගෙනීමට ඇති උනන්දුව අඩුකම මතයි. මෙය වළක්වා ගැනීමට අප දිගින් දිගටම කටයුතු කළත් එය පාලනය කර ගැනීමට නොහැකි වී තිබේ. පුහුණුවන්නන් සඳහා දීමනාවක් ලබා දෙන්නේ ඔවුන්ගේ පැමිණීම 80% නම් පමණි. තවද ඔවුන්ගේ දීමනාව මාස දෙකකට වරක් ලබා දෙන අතර අවසාන මාසික දීමනාව ලබා දෙන්නේ විභාගයට පෙනී සිටියහොත් පමණක් බැවින් පරතරය යම් ප්‍රමාණයකට සීමා වේ. කෙසේ වෙතත්, අපගේ අභ්‍යාසලාභීන්, පවුල් මූලික කාන්තාවන් සහ ග්‍රාමීය ප්‍රදේශවල මූලික ජීවනෝපායක් සොයන පාසල් හැර ගිය අය වෙති. එසේම ඔවුන්ට ලබා දෙන දෛනික දීමනාව ඔවුන්ගේ ප්‍රවාහන හා අනෙකුත් වියදම් සඳහා දීමනාවකි. එබැවින් දීමනා ලබා දෙන්නේ ඔවුන් පැමිණෙන කාලය සඳහා පමණි. එමෙන්ම ඔවුන් ග්‍රාමීය ප්‍රදේශවලට නොපැමිණීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සමාජ අතර ගැටලු රැසක් ඇති කරන බව දන්වා සිටිමි | කාර්යසාධනය වැඩි දියුණුවන පරිදි පුහුණු කිරීම් ඵලදායකව සිදුකල යුතුය. |

### 1.5.3 ශීර්ෂය - 920 ප්‍රධාන ලේකම් කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීමේ වාර්තාව මත පදනම්ව වැඩ කරන වේලාවන් සහතික කර ගනිමින් නිවාඩු දින වැටුප් සහ අතිකාල ගෙවීම් සිදුකළ යුතුය. එසේ වුවද, විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් සමාලෝචිත වර්ෂය තුළ ඇඟිලි සලකුණු යන්ත්‍රය අනුව පැමිණීම සහ පිටවීම තහවුරු | අනාගතයේදී මේ ආකාරයේ අඩුපාඩු අවම කර ගැනීම සඳහා මේ වනවිටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. | චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරගැනීමකින් තොරව එකතුව රු.මිලියන 2,459 ක නිවාඩු දින වැටුප් සහ අතිකාල ගෙවා තිබුණි. | | |
| (ආ) | ව්‍යාපෘතියක විෂය පථය තුළ සැලසුම් කළ වියදමක් එහි පවතින යම් වැය විෂය ක්ෂේත්‍රයකට නොගැලපේ නම් සහ එවැනි වැය විෂය ක්ෂේත්‍ර එකක් හෝ කිහිපයක් යටතේ නිශ්චිත ඉතුරුම් තිබේ නම්, ප්‍රධාන ලේකම්වරයාට ප්‍රමිතිගත වැය විෂය ක්ෂේත්‍ර ලැයිස්තුව සමඟ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා නව වැය විෂය ක්ෂේත්‍රයක් නිර්මාණය කිරීමට අවසර දිය හැකිය. එසේ වුවද ඊට පටහැනිව, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නව වැය විෂය ක්ෂේත්‍රයන් ඇති කරමින් පරිපූරක ප්‍රතිපාදන සිදු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ එම වැය විෂය ක්ෂේත්‍රය යටතේ රු.354,912 (එ.ජ.ඩො. 960) ක මුදලක් විදේශ ගමන් සඳහා වැය කර තිබුණි. | පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා නව වැය විෂය ක්ෂේත්‍ර අංක නිර්මාණය කර ඇත්තේ විදේශ සංචාර හැර පවතින වැය විෂය ක්ෂේත්‍ර අංක විස්තර වලින් මාරු කරන ලද සියලුම වැය විෂය ක්ෂේත්‍ර අංක සහ ප්‍රතිපාදන සඳහා ප්‍රමිතිගත වැය විෂය ක්ෂේත්‍ර අංක ලැයිස්තුව තුළ ය. විදේශ ගමන් වියදම් වැය විෂය ක්ෂේත්‍ර අංකය නිර්මාණය කර පරිපූරක වෙන් කිරීම් සිදු කරනු ලැබුවේ එම ගෙවීමේ නිසි අධිකාරිය සහතික කිරීම සහ විදේශ ගමන් වියදම් සඳහා මධ්‍යගත තොරතුරු පවත්වාගෙන යාම හේතුවෙනි. | පළාත් මුල්‍ය රෙගුලාසි වලට අනුගත වීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | නැඟෙනහිර පළාතේ විවිධ දෙපාර්තමේන්තු, ලේකම් කාර්යාලයකට හා අමාත්‍යාංශයකට අයත් ඉඩම් 81ක්, වාහන 98ක්, යතුරුපැදි 71ක්, රජයේ නිල නිවාස 97ක්, කාර්යාල ගොඩනැඟිලි 28ක්, තානායම් 02ක් සහ වාරිමාර්ග වැව් 51ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබුණු අතර ඉහත නිල නිවාස සහ තානායම් පිහිටි ඉඩම්වල ඔප්පු, මිනින්දෝරු සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කෘෂිකාර්මික වාහන සහ යතුරුපැදි අගය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර ඒවා ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන එනු ඇත. මේ සඳහා ඉල්ලීම්කර තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. අපගේ තොරතුරු අනුව ලැයිස්තුගත නිවාස 10 ක්, පවුල් නිල නිවාස 20 ක්, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල නිල නිවාස 1 ක් සහ පිරිමි සහ ගැහැණු යන දෙඅංශයෙන්ටම නිවාස 03 ක් ඇතුළුව නිල නිවාස කාණ්ඩය යටතේ සමාන පරිශ්‍ර 34 ක් අපගේ විෂය පථයට අයත් වේ. ඉහත සඳහන් කළ පරිශ්‍ර ලැයිස්තුව අතර ලැයිස්තුගත නිල නිවාස 10 ක් දෙපාර්තමේන්තුව විසින් ඇගයීමට ලක් කර ඇති අතර ඒවා තක්සේරු කිරීමේ වාර්තාව මෙතෙක් ලැබී නොමැත. මීට අමතරව ඇගයීම් ක්‍රියාවලියට ඇතුළත් මිනුම් සැලැස්මක් සන්තකයේ තබා ගැනීමට අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත අපි ලිපි යවා ඇත. | මූල්‍ය නොවන සියළුම වත්කම් ප්‍රමාදයකින් තොරව අගය කිරීම සඳහා කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සනීපාරක්ෂක සහ ආරක්‍ෂක සේවා සඳහා යොදවා ඇති සේවකයන් වෙනුවෙන් රු.57,786,846 ක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකත්වයක් ලෙස අදාල සේවා සපයන ආයතනය වෙත සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණ ද, මෙම දායක මුදල් අදාල ආයතන වෙත ප්‍රේෂණය කළේද යන්න තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ලබාගෙන නොතිබුණි. තවද ඉහත දායක මුදල් මත ගණනය කරන ලද රු.6,304,937 ක එකතු කළ අගය මත බද්ද එම ආයතනය වෙත අවිධිමත් ලෙස ගෙවා තිබුනද එම අවිධිමත් ගෙවීම් මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇතිකර ගන්නා ලද ගිවිසුම අනුව ගෙවන ලද මුළු වැටුප් වටිනාකම මත එකතු කළ අගය මත බද්ද ගෙවීම් කර ඇත. කොන්ත්‍රාත්කරු විසින් මෙම මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා ඇත. | කොන්ත්‍රාත්කරු විසින් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා ඇති බවට තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කලයුතු අතර සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල මත ගෙවා ඇති එකතු කළ අගය මත බද්ද නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ලෝක බැංකු ආධාර මත ඉදිකරන ලද මල්වතු සුරිපොඩෙයි පාරේ (0+360 සහ 2+920) පාලම් 02ක් ඉදිකිරීම සම්බන්ධයෙන් මතු වූ ආරවුල සමථයකට පත් කිරීම සඳහා 2021 වසරේ අග භාගයේදී පළාත් සභාව විසින් රු.මිලියන 150ක වන්දි මුදලක් කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවා තිබුණි. පහත හේතූන් මත කොන්ත්‍රාත්කරුට ගෙවන ලද වන්දි මුදල රජයට සිදු කරන ලද අලාභයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.<br><br>(i) විනිශ්චය සභා ක්‍රියාවලියේදී වන්දි වශයෙන් රු.මිලියන 40 ක් සහ පළාත් සභාව විසින් කොන්ත්‍රාත්කරුගෙන් දැනටමත් අයකර ගෙන තිබූ තවත් රු.මිලියන 37.8ක් ඇති ප්‍රමාද ගාස්තු ආපසු ගෙවීමෙන් මෙම ආරවුල සමථයකට පත් කිරීමට එකඟ වී තිබුණ ද, විනිශ්චය සභාව විසින් ලබා දුන් තීන්දුව සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බව පවසමින් ප්‍රධාන ලේකම්වරයා බේරුම්කරණ ක්‍රියාවලියක් සංවිධානය කර තිබුණි. ඉන් පසුව බේරුම්කරණ මණ්ඩලය ලබාදුන් තීන්දුවට අනුව මෙම ආරවුල සමථයකට පත් කිරීම සඳහා පළාත් සභාව විසින් රු.මිලියන 150ක මුදලක් වන්දි | රු.මිලියන 150 ක බේරුම්කරණ වන්දි ගෙවීම අනුමත කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත. කෙසේ වෙතත් බේරුම්කරණයට ප්‍රමාණවත් වන්දි මුදල් තිබේ නම් පළාත් සභා අරමුදලින් එය ගෙවන ලෙසට ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලැබී තිබුණි. | මෙම ගෙවීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් ලබාගත යුතු වුවද එසේ කර නොතිබූ අතර පළාත් සභාවට සිදු වූ පාඩුව අය කර ගැනීමටද කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් ගෙවීමට නියෝග කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 72.2ක පාඩුවක් පළාත් සභාවට සිදු වී තිබුණි.<br><br>(ii) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයා විසින් යවන ලද 2019 අප්‍රේල් 09 දිනැති අංක BD/GPS/321/02/02 දරන සහ 2021 ජනවාරි 22 දිනැති අංක PL/05/04/PRP(WB)/Eastern/2015-Vol1 දරන ලිපි වලට අනුව, රු.150,000,000 ක වන්දි මුදල ගෙවීමට පෙර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බව දැනුම් දී තිබුණි. නමුත් එසේ ලබාගත් අනුමැතියන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඊ) | පළාත් සභාවේ අමාත්‍යාංශ සහ විවිධ දෙපාර්තමේන්තු සඳහා අභ්‍යන්තර විගණකවරුන් පත් කර තිබුණද, එම නිළධාරීන්ගේ අභ්‍යන්තර විගණන වාර්තා සහ පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කරන ලද නිර්දේශයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙතෙක් පිළිතුරු ලබා නොදුන් ආයතන ප්‍රධානින් වෙත ලබා දුන් නිර්දේශය ඇතුළත් අභ්‍යන්තර විගණන වාර්තාව ජාතික විගණනයට ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනවා. 2023 වර්ෂයේ 2 වන කාර්තුවේ සිට අපි වාර්තාවේ පිටපතක් රජයේ විගණනය වෙත නිරීක්ෂණය සඳහා යවන්නෙමු.<br>කෙසේ වෙතත්, 2022 වර්ෂයේදී පොතුවිල් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ සහ වෙන්කලඩි වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ සහ කුචවේලි සහ ත්‍රිකුණාමලය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල අභ්‍යන්තර විගණනයක් පවත්වා වාර්තාව එවා ඇති බව දන්වා සිටිමි. | අභ්‍යන්තර විගණන වාර්තා සහ ඔවුන්ගේ නිරීක්ෂණයන් විගණනයට ඉදිරිපත් කල යුතුය. |

**1.5.4 ශීර්ෂය - 921 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය- මූල්‍ය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සභාව විසින් රු.මිලියන 1.2ක් වැය කර වත්කම් කළමනාකරණ පද්ධතියක් (AMS) ස්ථාපිත කර තිබුණද, පසුගිය වසර 02 තුළ මෙම පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි. එබැවින් පළාත් සභාවට වත්කම් කළමනාකරණය කාර්යක්ෂමව කර ගැනීමට නොහැකි වී තිබුණි. | පසුගිය වසර 02 ක කාලය තුළ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම සිදු කර නොමැති බැවින්, AMS පද්ධතිය අත්හිටුවන ලදී. එබැවින් දත්ත සමුදාය යාවත්කාලීන නොවීය. නමුත්, දැන් අපි මෙම වසරේ පද්ධතිය සක්‍රිය කිරීම නැවත ආරම්භ කර ඇති | දත්ත යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර එය අනෙකුත් පළාත් මෙන් CIGAS යාවත්කාලීන කළ නව අනුවාදය සමඟ ඒකාබද්ධ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතර පුහුණු සැසි 2023 ජූලි 26 වන දින ක්‍රියාත්මක කරන ලදී. එබැවින්, ඉදිරි වසරවලදී පෙර පරිදි දත්ත යාවත්කාලීන කෙරේ. | |
| **(ආ)** | නැහෙනහිර පළාතේ සමස්ත දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ විසින් සමාලෝචිත වර්ෂය සඳහා CIGAS මෘදුකාංග පද්ධතිය භාවිතයෙන් ජනනය කරන ශේෂ පිරික්සුම සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | නැගෙනහිර පළාතේ සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මාසික ගිණුම් සාරාංශය සකස් කිරීම සඳහා නව CIGAS 2.3.0 මෘදුකාංගය භාවිතා කරන අතර එය 2022 ජනවාරි සිට පළාත් භාණ්ඩාගාරයේද භාවිතා කරනු ලැබේ.<br>2022.05.02 දිනැති PT/07/2022 චක්‍රලේඛය මගින් සියලුම ආයතන වෙත ශේෂ පිරික්සුම ද සකස් කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලෙස වැඩිදුර උපදෙස් ලබා දී ඇත. කෙසේ වෙතත්, එයට 2.3.0 අනුවාදයෙන් 2022 වසර සඳහා ඒකාබද්ධ ශේෂ පිරික්සුම ලබා ගැනීමට නොහැකි විය. තවද, දැන් අපි නව CIGAS නවතම අනුවාදය වෙත සාර්ථකව යාවත්කාලීන කර ඇති අතර අනාගතයේදී CIGAS පද්ධතියෙන්ද එය ලබාගනු ඇත. | CIGAS මෘදුකාංගයේ නව අනුවාදයක් ස්ථාපනය කර ඉදිරි වර්ෂයේදී ශේෂ පිරික්සුම සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ඇ)** | නැගෙනහිර පළාතේ 2008 අංක 01 දරන මුදල් ප්‍රඥප්තියේ 89(1) වගන්තියට අනුව මුද්දර ගාස්තු ගෙවීම ප්‍රතික්ෂේප කළ පුද්ගලයන්ට එරෙහිව පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. එසේ වුවද, 2014 පෙබරවාරි 01 වන දින සිට මේ දක්වාම එවැනි පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබුණි. | වී. මහේන්ද්‍රනාදන් මහතා නැගෙනහිර පළාත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ලෙස 2020.11.05 දින පත්කිරීමෙන් පසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන අතිවිශේෂ ගැසට් නිවේදනය නැවත නිකුත් කිරීමට පහත අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>අ) මුලින්ම අපි ගැසට් නිවේදනය භාෂා තුනෙන් සකස් කර 2022.09.01 දින අනුමැතිය/කැමැත්ත ලබා ගැනීම සඳහා නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරවරයා වෙත නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් මගින් යවන ලදී.<br>ආ) නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය වෙතින් අනුමැතිය සහිත ලිපිය ලැබුණු අතර 2023.06.12 දින නැගෙනහිර පළාත් පළාත් නීති ඒකකය විසින් කරන ලද නෛතික නිරීක්ෂණ අනුව නිවැරදි කිරීම් සිදු කරන ලෙස දක්වා ඇත.<br>ඇ).පළාත් නීති ඒකකය විසින් | තවදුරටත් ප්‍රමාදයකින් තොරව අතිවිශේෂ ගැසට් නිවේදනය නැවත නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

<table>
<tr><th></th><th></th><th></th><th></th></tr>
<tr><td></td><td></td><td>06.07.2023 දින කරන ලද නෛතික නිරීක්ෂණ අනුව නිවැරදි කිරීම් සිදු කිරීමෙන් පසු ලිපිය යවා ඇත.</td><td></td></tr>
<tr><td>(ඇ)</td><td>2018 සිට 2022 වර්ෂය දක්වා ගෙවීම් පැහැර හරින ලද අයගෙන් මුද්දර ගාස්තු අය කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව ඉටු කර නොතිබියදීත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ඊට අදාල නිලධාරීන්ට දිරි දීමනා ලෙස රු.11,188,360 ක මුදලක් ගෙවා තිබුණි.</td><td>කාර්යාලයේ ආදායම් සේවා සේවක සංඛ්‍යාවේ යම් ඌණතා / පුරප්පාඩු තිබුණද රාජකාරිවල යම් දියුණුවක් ඇති අතර මුද්දර ගාස්තු එකතු කිරීම සහ පළාත් පාලන ආයතන වෙත මුදල් ආපසු ලබා දීමේදී කාර්යාලය පහත සඳහන් පරිදි බදු එකතු කිරීමේ ඉලක්ක සපුරා ඇත.
<table>
<tr><th>Year</th><th>Target (Mn)</th><th>Achievement</th></tr>
<tr><td>2019</td><td>360</td><td>469,216,920.35</td></tr>
<tr><td>2020</td><td>337.5</td><td>449,580,571.00</td></tr>
<tr><td>2021</td><td>500</td><td>714,810,468.50</td></tr>
<tr><td>2022</td><td>550</td><td>828,752,253.58</td></tr>
</table>
ඒ අනුව, කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දිරිගැන්වීම් ලබා ගැනීමට හිමිකම් ඇති අතර, එමගින් අනාගතයේදීද දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරා ගැනීම සඳහා සියලුම කාර්ය මණ්ඩලයේ වැඩ කිරීමේ හැකියාව වැඩිදියුණු කරනු ඇත.</td><td>වත්කම් මාරු කරන්නා විසින් මුද්දර ගාස්තු ගෙවන බැවින් ඉලක්කය සපුරා ගත හැක. කෙසේ වෙතත්, දඩ මුදල සහ මුද්දර ගාස්තුවෙන් ලැබිය යුතු ඉතිරිය ආදායම් නිලධාරියා විසින් එකතු කරනු ලැබේ. එබැවින් ආපසු බදු එකතු කිරීම ඉහළ නැංවීම නිර්දේශ කෙරේ.</td></tr>
<tr><td>(ඉ)</td><td>2008 අංක 01 දරන නැඟෙනහිර පළාත් මුදල් ප්‍රඥප්තියේ 88.2 සහ 89.1 වගන්තිවලින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත පවරා තිබූ රාජකාරි කිසිවක් ඉටු කර නොතිබුණි.</td><td>2012 වසරේ හිටපු කොමසාරිස් ශ්‍රීසෙල්වනායගම් මහතා විශ්‍රාම ගැනීමෙන් පසු එම්.අයි.එම්.මහීර් මහතා 2014.02.01 සිට 2021.07.31 දක්වා වැඩබලන නියෝජ්‍ය කොමසාරිස් ලෙස කටයුතු කළ අතර, 2008 අංක 01 දරන මුල්‍ය ප්‍රඥප්තියේ 88.1 සහ 89.1 වගන්තිවලට අනුව කොමසාරිස්වරයා වෙත ඉහත සඳහන් රාජකාරි සඳහා බලය පවරා ඇත. එබැවින් 2013.01.01 සිට 2020.11.04 දක්වා කාලය තුළ කොමසාරිස්වරයාට පවරා ඇති රාජකාරි අවසන් කර නොමැත. මුද්දර ගාස්තු ගෙවීම ප්‍රතික්ෂේප කරන පුද්ගලයාට/බදු ගෙවන්නාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන අතිවිශේෂ ගැසට් නිවේදනය නැවත නිකුත් කිරීමට මේ වන විට කටයුතු කර ඇත.</td><td>තවදුරටත් ප්‍රමාදයකින් තොරව අතිවිශේෂ ගැසට් නිවේදනය නැවත නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| (ඊ) | නැගෙනහිර පළාත් සභාවේ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන 8 කට අදාලව රජයේ නිලධාරීන්ගෙන් අයකර ගතයුතු අත්තිකාරම් ගිණුම් ශේෂය රු.මිලියන 16.86 ක් වසර 05 කට වැඩි කාලයක පටන් අයකර ගෙන නොතිබුණි. | රු.143,926.00 ක හිඟ ආපදා ණය ශේෂය අයි.නලායිනි මහත්මිය විසින් ගෙවීමට ඇති ශේෂය බව ඔබට දන්වා සිටින අතර ඇය 2008.09.29 දින තනතුර අතහැර ගොස් ඇත. අප කිහිප වතාවක් ලිඛිතව දැනුම් දීමෙන් පසු ඇයගේ මව වන අයි.වල්ලියම්මා විසින් 2019 වර්ෂයේදී 15,000.00ක් ගෙවා ඇත. රුපියල් 129,757.51 ක ඉතිරි ශේෂය ආපසු අයකරගත නොහැකි මුදලක් වේ. අපි අයි.වල්ලියම්මා සම්බන්ධ කර ගත් අතර එළඹෙන අගෝස්තු/සැප්තැම්බරයේ හිඟ ණය ගෙවීමට ඇය එකඟ විය. අයි.නලායිනි මහත්මිය ගෙවීමට අපොහොසත් වුවහොත් නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන නීති නිලධාරියා සමඟ සාකච්ඡා කර ඇයගෙන් අයවිය යුතු ණය ආපසු අයකර ගැනීමේ පසු විපරම් ක්‍රියාමාර්ගය අපි ආරම්භ කරන්නෙමු.<br>අප සතුව රු.165,848.75 ක තවදුරටත් නොවිසඳුණු ණය දෙකක් පවතින අතර ලියාපදිංචිය හඳුනාගැනීම මැතිවරණ කොමිසමට ලිපි යවා ඇත. ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරියාගෙන් ආපදා ණය වාරික මුදල නිතිපතා අපට ලැබේ. කන්තලේ ප්‍රාදේශීය සභාව විසින් එම ණය ශේෂය රු.1,102,903.93 සිට රු.951,513.40 දක්වා අඩු කර ඇත. සාමාජිකයින් තිදෙනෙකු සම්පූර්ණයෙන් ගෙවා ඇත. | හිඟ ශේෂය හැකි ඉක්මනින් අදාළ නිලධාරියාගෙන් අයකර ගත යුතුය. |
| (උ) | පළාත් සභාව විසින් 2018 ජනවාරි සිට ජංගම බැංකු ගිණුම් තුනක ආසන්න වශයෙන් රු.මිලියන 414 ක ශේෂයක් කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව තිබූ අතර 2022 දෙසැම්බර් මාසය අවසන් වන විට එය රු.මිලියන 639.59 දක්වා ඉහළ ගොස් තිබුණි. ඉහත පරිදි 2018 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා කාලය තුළ බැංකු ජංගම ගිණුම්වල මුදල් අක්‍රියව පැවතීමට ඉඩ දීමෙන් රජයට දළ වශයෙන් රු.මිලියන 281.16 ක මූල්‍ය පාඩුවක් සිදුවී ඇත. | මුද්දර ගාස්තු අදායම් එකතු කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන මෙම බැංකු ගිණුම් දෙක ඉතුරු කිරීම් ගිණුම් මිස ජංගම ගිණුම් නොවේ. මෙම ඉතුරු කිරීම් ගිණුම් වලින් 2018 සිට 2022 දක්වා වූ කාලය තුල රු. මිලියන 100 කට වැඩි පොලියක් උපයාගෙන ඇත. තවද 2023.04.11 දින මේ සඳහා නව ස්ථාවර තැන්පතු ගිණුමක් විවෘත කරන ලද අතර ඒ මත මේ දක්වා රු. මිලියන 21 ක පොලියක් අප හට ලැබී ඇත. | පළාත් සභාව සතු මුදල් කාර්යක්ෂමව හා ඵලදායකව ආයෝජනය කිරීමට කටයුතු කලයුතුය. |

## 1.5.5 ශීර්ෂය - 923 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - පරිපාලන

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිල නිවාසවල කුලිය තීරණය කිරීමට පෙර ප්‍රධාන තක්සේරු නිලධාරියාගේ තක්සේරු වාර්තාව ලබා ගත යුතුය. කෙසේ වෙතත්, වසර 10 කට පෙර ලබාගත් තක්සේරුව මත පදනම්ව නිල නිවාස 66 ක් සඳහා දිගින් දිගටම ආර්ථික කුලියක් අයකරමින් පැවතුණි. | 2018 – 2020වර්ෂයෙන් ආරම්භ වී 2021 - 2023 දක්වා වන කාලසීමාව සඳහා කාර්ය මණ්ඩල නිල නිවාසවල ආර්ථික කුලී තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද අතර කුලී වාර්තාව වසර 3 ක් සඳහා බලපැවැත්වේ. තක්සේරු කරන ලද මාසික ගාස්තුව අනුව, ලේකම්වරුන්ගෙන් හැර 5.8 වගන්තියේ විධිවිධාන අනුව එය අය කෙරේ. 2021-2023 වර්ෂය සඳහා යෝජිත කුලී ගාස්තුව අනුව අපි අය කරන්නෙමු. එසේම නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ 2019 ජූලි 17 වන දිනැති අංක G/EPC/C/19/Qu දරන ලිපියද සැලකිල්ලට ගනු ලැබේ; සියලුම ලේකම්වරුන්ගේ සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ කුලී ගාස්තුව සංශෝධිත රුපියල් 1000/- ලෙස වෙනස් කරනු ලබන අතර එම පදිංචිකරුගේ උපයෝගිතා බිල්පත් වලින් 50%ක් දරයි. කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ ප්‍රභූවරුන් සඳහා නව මාසික කුලිය අයකර ගැනීමට අප සලකා බලන අතර ඉදිරි කටයුතු සඳහා එම ලිපිය ප්‍රධාන ලේකම්වරයා වෙත යවා ඇත. | ඉදිරියේදී එක් එක් නිලධාරියාගෙන් අදාළ කුලී අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.5.6 ශීර්ෂය - 924 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - ඉංජිනේරු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නැගෙනහිර පළාත් සභාවට අයත් නොවන අම්පාර සංස්කෘතික රඟහල සහ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාල නේවාසිකාගාරය වෙනුවෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - ඉංජිනේරු අංශය විසින් රු.15,000,000 ක මුදලක් වියදම් කර තිබුණු අතර එම වියදම්ද අරමුදල් ගිණුමේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව පළාත් සභාවේ විෂය පථයට අයත් නොවන කාර්යයන් සඳහා දැරූ වියදම් බව මෙයින් නිරීක්ෂණය වේ. | අම්පාර සංස්කෘතික රඟහල සහ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිවාසය ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ඇතිව නැගෙනහිර පළාත් සභාවෙහි පොදු යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ප්‍රතිසංස්කරණය කෙරේ. | වියදම් වර්ගීකරණය අදාළ පිළිගත් පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහල් 04 කින් සමන්විත ගොඩනැගිල්ල සඳහා ඇලුමිනියම් සවිකිරීම, ජල සම්බන්ධතාවය, විදුලිය සැපයීම සහ අවසන් ඉදිකිරීම් සහ ස්විච් කාමරය සවි කිරීම වැනි කටයුතු සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉංජිනේරු අංශය හරහා රු.17,175,995 ක මුදලක් වැය කර තිබුණි. එසේ වුවද, 2023 මැයි 10 විගණන දිනය වන විටත් එය දෙපාර්තමේන්තුවේ කාර්යාල කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. | සිව්මහල් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල සහ පළමු මහල 2023 අගෝස්තු 15 හෝ ඊට පෙර භාවිතා කිරීමට කටයුතු කර ඇති අතර නිම කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. | වත්කම් නිෂ්ක්‍රීයව තබා නොගෙන ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

**1.5.7 ශීර්ෂය - 927 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද විශේෂ තක්සේරු මණ්ඩලයක් මගින් රු.2,359,800 ක් වටිනා මෝටර් රථ 12 ක් ඉවත් කිරීමට නිර්දේශ කර තිබුණද, 2023 වන විටත් ඒ අනුව කටයුතු නොකර අඛණ්ඩව භාවිතා කර තිබුණි. | වාහන 12ක් සඳහා 2023/06/07 දිනැති අංක EP/12/13/004/Veh.Auction/2023 යන ලිපිය මගින් හිමිකාරිත්වයේ නම වෙනස් කිරීම හෝ බැහැර කිරීම සඳහා ක්‍රියා කර ඇත.<br>තවද, නැගෙනහිර පළාතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා විසින් වාහන 10ක් අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර ඇති අතර වාහන 2ක හිමිකාරිත්වය ඔහුගේ 2023.07.24 දිනැති අංක EP/DMT/CMSO/General(Vehicle) 2023 දරන ලිපියට අනුව වෙනස් කර ඇත. | පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් පත්කරන ලද විශේෂ තක්සේරු මණ්ඩලයේ නිර්දේශ මත කටයුතු කල යුතුය. |

**1.5.8 ශීර්ෂය - 930 - කෘෂිකර්ම අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය තුළ "තිරසර කෘෂි සංස්කෘතිය" කාබනික කෘෂිකාර්මික වැඩසටහන යටතේ ISO ප්‍රමිතියෙන් යුත් රසායනාගාරයක් ඉදිකිරීම සහ අවශ්‍ය උපකරණ සහ යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට රු.මිලියන 200 ක මුදලක් ලබා දී තිබුණි. එයින් රු.මිලියන 4.5ක් පමණක් 2023 අප්‍රේල් 30 දක්වා ඉහත | කොම්පෝස්ට් පොහොර, පස සහ කාබනික නිෂ්පාදන විශ්ලේෂණය කිරීම සඳහා නවීන රසායනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 200 ක් වෙන් කරන ලදී. මේ සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයක් වන කාර්මික තාක්ෂණ ආයතනය වෙත එම රසායනාගාරය පිහිටුවීමේ ක්‍රියාවලිය | අනුමත අරමුදල ඵලදායී ලෙස හා කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යය සඳහා උපයෝජනය කර තිබුණද එයින් අමාත්‍යාංශයට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්තු ලබා දී ඇත. මේ සඳහා ගොඩනැගිල්ලක් ලබා ගැනීමට වී අලෙවි මණ්ඩලය සමග එකගතාවයක් ඇතිකරගෙන ඇත.කාබනික කෘෂිකර්මය පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය වෙනස් වීම මත ඒ සඳහා ඇති ඉල්ලුම අඩු වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. එවැනි තත්ත්වයක් යටතේ ව්‍යාපෘතිය නතර කිරීමට තීරණය විය. කෙසේ වෙතත්, බීජ පරීක්ෂා කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීම සඳහා ඉදිරියට යාමට අප සැලසුම් කර ඇති අතර, ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර අවශ්‍ය රසායනාගාර උපකරණ ලබා ගැනීමට කටයුතු කරමින් සිටිමු. | |
| (ආ) | කාබනික කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී රු.35,348,600 ක වටිනාකමකට කොළ කපන යන්ත්‍ර 60 ක් මිලදී ගෙන නැගෙනහිර පළාතේ ආයතන 60 කට සපයා තිබුණි. කෙසේ වෙතත්, 2023 අප්‍රේල් 30 විගණන දිනය දක්වාම එම යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා රෝද හතරේ ට්‍රැක්ටරයක් නොතිබීම හේතුවෙන් යන්ත්‍ර වලින් සියයට 50 ක්ම අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි. | පැවති රජයේ කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය අතහැරීමට පෙර ප්‍රකාශ කල පරිදි මෙම යන්ත්‍ර සඳහා ගොවි ප්‍රජාවගෙන් තිබු ඉල්ලුම අඩු විය. එම නිසා මෙම යන්ත්‍රෝපකරණ සියයට 50 ක් භාවිත කරන ලදී. එවැනි තත්ත්වයක් යටතේ ප්‍රයෝජනයට නොගත් යන්ත්‍රෝපකරණ පළාත් සභාව වෙත නැවත ලබාගෙන එම යන්ත්‍ර වල වටිනාකමින් සියයට 50 ක් නැගෙනහිර පළාත් කෘෂිකර්මික දෙපාර්තමේන්තුවට ගෙවීමේ හා ඉතිරි සියයට 50 මාසික වාරික ලෙස ගෙවීමේ පදනම යටතේ ගොවීන් වෙත ලබාදීමට කටයුතු කරමින් පවතී. | මිළදී ගන්නා ලද වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය කරන අමතර උපකරණ මිලදිගෙන සැපයීමට කටයුතු කලයුතුය. |
| (ඇ) | පළාතේ සාර්ථකව ක්‍රියාත්මක වන ගොවි ප්‍රජාවන්ට ත්‍යාග පිරිනැමීමේ අරමුණින් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රොටවේටර් සහිත අත් ට්‍රැක්ටර් 32ක් රු.14,816,000කට මිල දී ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2023 අප්‍රේල් 30 විගණන දිනය දක්වාම සාර්ථක ගොවි ප්‍රජාවන් තෝරා ගැනීමේ කාර්යයන් සිදු කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබූ අතර එම ට්‍රැක්ටර් වසර 01කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | මෙමගින් ගොවි සංවිධාන දිරිමත් කිරීමට සැලසුම් සකස් කර තිබූ නමුත් රෝද දෙකේ ට්‍රැක්ටර් ලැබෙන විට මහා කන්නය අවසන් වෙමින් තිබුණි. ඒ නිසා සැලසුම් කල පරිදි මෙම වැඩ කටයුතු කරගෙන යාමට නොහැකි විය. | වෙන් කරන ලද අරමුදලින් උපරිම ප්‍රයෝජනය ගැනීමට කටයුතු කල යුතුය. |

**1.5.9 ශීර්ෂය - 931 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය තුළ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා රු. මිලියන 30 ක මුදලක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණ ද, එයින් රු.21,934,350 ක් 2023 අප්‍රේල් 17 දින දක්වාම ඉහත කාර්යය සඳහා යොදවා නොතිබුණි. | මෙම මිලදී ගැනීම සඳහා මිලගණන් කැඳවා මිලදී ගැනීමේ නියෝගයක්ද නිකුත් කරන ලදී. කෙසේවෙතත් covid වසංගතය හා රට තුල තිබූ ඩොලර් හිඟය හේතුවෙන් හා භාණ්ඩ වල මිල විශාල ලෙස වැඩිවීමත් මත අදාල සැපයුම්කරුවන්ට භාණ්ඩ ආනයනය කර සැපයීමට නොහැකි විය. | මෙම මුදල් නිශ්චිත අරමුණු සඳහා කාලීනව යොදා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ‘‘තිරිසර කෘෂි සංස්කෘතිය’’ කාබනික කෘෂිකර්ම වැඩසටහන යටතේ අනෙකුත් ක්ෂේත්‍ර භෝග (OFC) සඳහා බීජ ගබඩා සංවර්ධනය කිරීමට රු.මිලියන 30 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, 2023 මාර්තු 31 වැනි විගණන දිනය වන විටත් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එම කාර්යය ආරම්භ කර නොතිබුණි. | රතු ළූණු වගාව සඳහා ඉසින සහ බඩ ඉරිඟු බීජ මිලදී ගැනීම සඳහා මෙම අරමුදල අප දෙපාර්තමේන්තුවට වෙන් කරන ලදී. මෙම මිලදී ගැනීම් සඳහා ලංසු කැඳවා, ප්‍රසම්පාදන තීරණය ගෙන, මිලදී ගැනීමේ ඇණවුමද අප දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, Covid-19 වසංගතය හේතුවෙන් රට තුළ ඇති වූ ඩොලර් හිඟය සහ රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් භාණ්ඩවල මිලෙහි විශාල වැඩිවීම සහ එම හේතුව මත සහ රට තුළ පනවා ඇති ආනයන සීමා කිරීම් හේතුවෙන් අදාළ සැපයුම්කරුට භාණ්ඩ ආනයනය කර බෙදා හැරීමට නොහැකි විය. | අනුමත අරමුදල ඵලදායී ලෙස හා කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගුණාත්මක පාරම්පරික බීජ වී නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ රු.33,748,615 ක් වටිනා බීජ වී කිලෝග්‍රෑම් 156,035 ක් මිලදී ගැනීමේදී පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.2 හා 3.3 ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු තැබීම හෝ ජාතික සීමිත තරඟකාරී ලංසු තැබීමේ පටිපාටිය අනුගමනය කර නොතිබුණි. මේ නිසා මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක සහ ගුණාත්මකව හොඳම සැපයුම් ලබා ගැනීමේ අවස්ථාව දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. තවද, සැපයුම්කරු වෙත ගෙවීම් කිරීමේදී වවුචරවලට අමුණා ඇති බිල්පත්වලට අනුව, රුපියල් මිලියන 2.6ක වටිනාකමට කිලෝග්‍රෑම් 14,124 ක බීජ වී සැපයීම සඳහා සැපයුම්කරුගේ නම ලෙස මෝටර් රථ උපකරණ හා ගොඩනැගිලි උපකරණ අලෙවි ආයතනයක නමක් සඳහන් කර තිබූ අතර එවැනි ආයතනයක් එම ලිපිනයේ නොතිබූ බව භෞතික පරීක්ෂාවේදී තහවුරු විය. | බීජ මිලදීගැනීමට පෙර පාරම්පරික බිත්තර වී සැපයීමට එකඟ වූ අයගේ බිත්තර වී පිළිබඳව ප්‍රාදේශීය කෘෂිකර්ම උපදේශකවරුන්ගේ පරීක්ෂාවකට ලක් කරන ලද අතර ඔවුන් ඉදිරිපත්කරන ලද වාර්තාව අනුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව පමණක් මෙම ප්‍රසම්පාදනය සිදු කරන ලදී. | රටට උපරිම ආර්ථික වාසිය හා තත්ත්වයෙන් උසස් නිෂ්පාදනයක් ලබාගත හැකි වන පරිදි කටයුතු කලයුතුය. |

### 1.5.10 ශීර්ෂය - 941 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජාතික පාසලක පරිශ්‍රයේ සවිකර තිබූ ආරක්ෂක කැමරාවේ සටහන් වූ දර්ශන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පුද්ගලික හේතුවක් මත කලාපයට වගකිව යුතු තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ සහය ඇතිව විනාශ කර ඇති බව නිරීක්ෂණය වී ඇත. මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්වරයා සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් විමසා ඇති අතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ අදහසට අනුව නිලධාරීන් 03 දෙනෙකු වෙනත් ආයතන වෙත මාරුකර යවා ඇත. | පනතේ විධිවිධානවලට කීකරු වීමට නිලධාරියාට වගවීමක් තිබිය යුතුය. ස්වාධීන පරීක්ෂණයක් කිරීමට කමිටුවක් පත් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | කිලෝමීටර් 39,083ක් ගමන් කිරීමට හේතු, අරමුණු සහ ගමන් කළ නිලධාරීන්ගේ නම් සහ තනතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් සකස් කර තිබූ ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි. තවද, දෛනික ධාවන සටහන්, අධීක්ෂණ නිලධාරියා විසින් නිරන්තරව පරීක්ෂා කර නොතිබුණි. එබැවින් එම වාහන රාජකාරී කටයුතු සඳහා භාවිත කරන ලද්දේ දැයි විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | කාර්ය මණ්ඩලය විසින් සංචිත වාහන නිල කාර්යයන් සඳහා භාවිතා කරයි. දිස්ත්‍රික්කය තුළ නිල අවශ්‍යතා සඳහා වාහනය භාවිතා කරන විට, එය සාමාන්‍යයෙන් ධාවන සටහනේ ඇතුළත් කර වාහනය භාවිතා කිරීමට හේතුව සහ වාහනය භාවිතා කළ කාර්ය මණ්ඩලය ද ධාවන සටහනේ අත්සන් කර ඇත. ඒ අතරම, දිස්ත්‍රික්කයෙන් පිටත සංචාරය | අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු භාවිත කරන වාහන පරීක්ෂා කර අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කිරීම සඳහා රාජකාරියේ ස්වභාවය, ගමන් කිරීමේ අරමුණ යනාදිය දක්වා අයදුම්පත්‍රයේ නිසි අනුමැතිය කාර්ය මණ්ඩලය විසින් නිසි ක්‍රමවේදය හරහා ලබාගෙන ඇත. කෙසේ වෙතත්, රියදුරන් විසින් මෙම තොරතුරු ධාවන ප්‍රස්ථාරයට ඇතුළත් කර නොමැති වන්නේ ඔහුට මේ සම්බන්ධයෙන් දැනුමක් නොමැති බැවිනි. අනාගතයේදී මෙවැනි වැරදි නැවත සිදු නොවනු ඇත. ධාවන ප්‍රස්ථාර නිසි ලෙස නඩත්තු කර ඇති අතර අධීක්ෂණ නිලධාරියා විසින් නිරන්තරයෙන් පරීක්ෂා කර ඇත. | |
| (ඇ) රු. 12,941,083 ක වියදමින් ජාතික පාසල්වල ඉදිකිරීම් කටයුතු සඳහා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර මෙම වැඩ කටයුතු 2021 අගෝස්තු 05 සිට 2021 දෙසැම්බර් 04 දක්වා කාලය තුළ අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.5,918,864 ක් ගෙවා තිබුණද වැඩ අවසන් කර තිබුණේ සියයට 50 ක් පමණි. | පිළිතුරු ලබා දී නොමැත. | අනුමත අරමුදල කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය - 951 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් සැපයූ තොරතුරුවලට අනුව, නැගෙනහිර පළාතේ පෞද්ගලික වෛද්‍ය ආයතන 507 ක් ක්‍රියාත්මක වේ. එසේ වුවද, පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ (වෙබ් අඩවිය) ලියාපදිංචි කර තිබුණේ පෞද්ගලික වෛද්‍ය ආයතන 38ක් පමණි. ඒ අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.5,295,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | මේ වන විට අප පෞද්ගලික සෞඛ්‍ය ආයතන 68ක් ලියාපදිංචි කර තිබේ. දැන් ලියාපදිංචිය සඳහා අයදුම්පත අන්තර්ජාලය හරහා සිදු කෙරේ. සියලුම ආයතන මාර්ගගත ක්‍රමය හරහා දැනුවත් කරන ලදී. ලැබුණු අයදුම්පත මත පදනම්ව ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ. | වෛද්‍ය ආයතන තවදුරටත් ප්‍රමාද නොකර පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේදී මඩකලපුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත වාහනවල GPS ලුහුබැඳීමේ පද්ධතිය යටතේ Mobile M-Track solution GPS පද්ධතිය වාහන 102කට සම්බන්ධ කර තිබුණි. කෙසේ වෙතත්, ඒ සම්බන්ධයෙන් අදාල අධීක්ෂන කටයුතු සිදුකළ බවට සාක්ෂි නොමැතිව 2018-2022 කාලය තුල රු.2,157,040 ක මුදලක් පද්ධති ක්‍රියාකරුවන් වෙත ගෙවා තිබුණි. | වාහනවල ගමනාගමනය සහ පිරිවැය අධීක්ෂණය කිරීම සහ භාවිතය පාලනය කිරීම ඔවුන් සතු වන බව මඩකලපුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ලිඛිතව දැන්ව ඇත. | මෙම උපකරණ අදාල කාර්යන් සඳහා භාවිතා කල බවට ප්‍රමාණවත් තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් වෙනුවෙන් රු.48,000,000ක් පමණක් ලබා දී තිබියදී ඒ සඳහා රු.64,341,596 ක මුදලක් වැය කර තිබුණි. ඒ අනුව අයවැය ප්‍රතිපාදන ඉක්මවා රු.16,341,596 ක මුදලක් වැය කර තිබූ අතර ඒ සඳහා පළාත් මූල්‍ය රෙගුලාසි 65.1 අනුව නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | “පළමුව, නිශ්චිත කාලයක් තුල වෛද්‍ය සැපයුම් මිල දී ගැනීමට වෙන් කළ අයවැයෙන් ඔබ්බට ගිය බව අපි පිළිගනිමු. උද්ධමනය හේතුවෙන් වෛද්‍ය සැපයුම්වල මිල හදිසියේ ඉහළ යාම ඇතුළු අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් මෙම තත්ත්වය ඇති විය.<br>මෙම අතිරික්ත මිලදී ගැනීම්වලට මූලික වශයෙන් හේතු වී ඇත්තේ හදිසි රෝගීන්ගේ පැමිණීම සඳහා අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම්වල හදිසි අවශ්‍යතාවයයි. සාමාන්‍යයෙන් අපි ඖෂධ මිලදී ගන්නේ වසරක කාර්තුවකට වේ. ඒ නිසා 2022 අවුරුද්දේ අපි ඖෂධ සංස්ථාවෙන් ආයුර්වේද ඖෂධ මිල වැඩි කළේ දෙවතාවක් පමණයි.<br><br>අපගේ ප්‍රමුඛතාවය සෑම විටම රෝගීන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව වන බැවින් වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා අමතර සැපයුම් මිලදී ගැනීමට අප ගත් තීරණය කළෙමු. තවද, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා අපි පහත පියවර ගනිමින් සිටිමු." | පළාත් මූල්‍ය රීති 65.1 අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | පළාත් සහා අරමුදලින් රු.81,698,727ක වියදම් දරා ඉදිකර තිබූ අඩ්ඩාලචේන ප්‍රාදේශීය රෝහලේ මාතෘ වාට්ටුව,කම්කරු කාමරය ළමා වාට්ටුව , ETU සහ OPD ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2021 මැයි 17 දින අවසන් කර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට භාරදී තිබුණද, මෙම වාර්තාවේ දිනය දක්වාම ගොඩනැගිලි සංකීර්ණය ප්‍රයෝජනයට නොගෙන වසර 02 කට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව තැබීමට ඉඩදී තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇති අතර දේශපාලන වෙනස්වීම් සහ **covid** වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රමාදයක් ඇති වී තිබෙන බවට සටහන් කිරීමට කැමැත්තෙමි. මේ නිසා ව්‍යාපෘතිය මුලින් සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2018 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පළාත් ජෛව වෛද්‍ය ඉංජිනේරු ඒකකයට ලැබී තිබුණු රු.25,461,600 ක් වටිනා වෛද්‍ය උපකරණ 51 ක් අලුත්වැඩියා කටයුතු සඳහා සේවා සපයන්නා වෙත නිකුත් කර තිබුණද, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාම එම උපකරණ අලුත්වැඩියා කටයුතු අවසන් කර නැවත ලබාගෙන නොතිබුණි. | අමතර කොටස් නොමැතිකම සහ අමතර කොටස්වල අධික මිල හේතුවෙන් මෙම ප්‍රමාදයට හේතු වී ඇත. කොටස් හුවමාරු කර එකක් අලුත්වැඩියා කළ හැකි බැවින් සමහර විට අර්ධ වශයෙන් හානි වූ උපකරණ පැමිණෙන තෙක් උපකරණ තබා ගැනීම සිදු කරනු ලැබේ. දැන් අලුත්වැඩියා කරන ලද සියලුම උපකරණ නැවත රෝහල වෙත ලබා දී ඇත. | වත්කම් නිෂ්ක්‍රීයව තබා නොගෙන ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ඊ) | මඩකලපුව ජෛව වෛද්‍ය ඉංජිනේරු ඒකකය මගින් 2020 සහ 2021 වසරවල මිලදී ගෙන තිබූ රු.1,842,000 ක් වටිනා වර්ග 6 ක වෛද්‍ය උපකරණ 114 ක් අදාළ රෝහල්වලට ලබා නොදී ඉහත ඒකක පරිශ්‍රයේ ගබඩා කර තිබුණි. | **Cholesterol meter** අලුත්වැඩියා කිරීම වැනි අවස්ථාවලදී භාවිතයට ගැනීම සඳහා මෙම මීටරය තබා ඇති අතර හදිසි අවශ්‍යතා සඳහා ඒවා ප්‍රයෝජනයට ගනී.<br>**Hematology Analyzer** වාකරයේ ප්‍රාදේශීය රෝහලේ ස්ථාපිත කර ඇත. එක් **microscope** උපකරණයක් කරදියනාරු දිස්ත්‍රික් රෝහල වෙත නිකුත් කර ඇති අතර අනිකුත් ඒවා හදිස්සි අවශ්‍යතා සඳහා තබා ඇත. **Sphygmomanometer** උපකරණයෙහි නිශ්චිත තොග ප්‍රමාණයක් පවත්වා ගත යුතු බැවින් එපරිදි තොගය පවත්වාගෙන යනු ලැබේ. | ලබා දී ඇති උපකරණ භාවිතයට ගැනීමට කටයුතු කලයුතුය. |
| (උ) | Defibrillator, Multipara Monitor, Transport Ventilator, Optiflow Nasal Oxygen Therapy සහ Fingertip - pulse Oximeter වැනි වෛද්‍ය උපකරණ 34 ක් කින්නියා මූලික රෝහලේ වසර 2 සිට 4 දක්වා කාලය තුළ අපේක්ෂිත කාර්යය සඳහා ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තබා ඇත. | කින්නියා මූලික රෝහල ඇඳන් **146** කින් සමන්විත වාට්ටු **, HDU , ETU ,** ශල්‍යාගාර සහ ප්‍රසූත වාට්ටු යනාදියෙන් සමන්විත වන අතර විශාල පිරිසකට එහි සෞඛ්‍ය සේවා සපයනු ලබයි.<br>සෞඛ්‍ය සැලසුම් ඒකකයක් ලෙස, සෑම සෞඛ්‍ය ආයතනයකම මෙම උපකරණ එහි ධාරිතාව අනුව තිබීම සහතික කළ යුතුය. ඒ අනුව මේ උපකරණ බෙදා දෙන ලදී. සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව වර්ග 07 ක ලැයිස්තුගත වෛද්‍ය උපකරණ 17ක් පොදු ගබඩාවේ නොතිබුණි. මෙම සියලු උපකරණ රෝහල්වල සේවා බෙදා හැරීමේ ඒකක වෙත ලබා දී ඇති අතර ඒවා භාවිතා කිරීම සඳහා විශේෂිත ඒකක වල තිබේ. DMO විසින් ඉදිරිපත් කරන ලද උපයෝගිතා විස්තර මේ සමඟ අමුණා ඇත. | ලබා දී ඇති උපකරණ ඵලදායීව භාවිතයට ගැනීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | පසුගිය වසරේ සහ සමාලෝචිත වර්ෂයේ නිල නිවාස අලුත්වැඩියාව සඳහා රු.3,012,505 ක මුළු මුදලක් වැය කර තිබුණද, එම නිල නිවාස නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වත්කම් නිෂ්ක්‍රීයව තබා නොගෙන ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (එ) | විගණනයට සපයා ඇති තොරතුරු අනුව රු.40,950,000 ක් වටිනා වාහන 06 ක් සහ නිශ්චිත වටිනාකම් නොමැති වාහන 05 ක් ඇතුළුව වාහන 11 ක් වසර 05 කට වැඩි කාලයක් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අළුත්වැඩියා කළ හැකි තත්ත්වය යටතේ රඳවා තිබුණි. 2023 අප්‍රේල් 24 වන විගණන දිනය දක්වාම ඒවා අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.5.12 ශීර්ෂය - 961 - මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්වල කාල සීමාවන්, යන්ත්‍ර නීතිවිරෝධී ක්‍රියා සඳහා භාවිත කරන්නේ නම් දෙපාර්තමේන්තුවේ වගකීම කුලීකරුට පැවරීමේ ප්‍රතිපාදන, ප්‍රමාද ගෙවීම් පිළිබඳ දැනුම්දීම සහ දෛනික සහ මාසික බෙදාහැරීමේදී පවත්වාගෙන යා යුතු නිශ්චිත වේලාවන් වැනි ගිවිසුම් වගන්ති මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශ වල කොන්ත්‍රාත් ගිවිසුම්වලට ඇතුළත් කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ ඒකකයේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් ගිවිසුමේ පැවති අඩුපාඩු කමිටුවක් මගින් නිවැරදි කර ඇති අතර නව කොන්ත්‍රාත් ගිවිසුම ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර සහ කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය විසින් දැන් භාවිතා කරනු ලැබේ. | කොන්ත්‍රාත් පරිපාලනය බලයලත් නිලධාරියෙකු විසින් නිතර සමාලෝචනය කළ යුතු අතර නියමයන් සහ කොන්දේසිය වල ඇති දුර්වලතා සොයා ගත හොත් අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ත්‍රිකුණාමලය යන්ත්‍රෝපකරණ කොට්ඨාශයට අයත් රු.33,600,000ක් වටිනා ඩෝසර් යන්ත්‍ර 02ක් බාහිර පාර්ශවයක් භාරයේ තිබූ බවට ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණ වූ අතර ඒ අතරින් රු.16,800,000ක් වටිනා එක් ඩෝසරයක කොටස් ඉවත් කර දිරාපත් වෙමින් පැවතුණි. | 2021.07.29 දිනැති ගිවිසුමට අනුව එම සමාගමේ ඉල්ලීම මත ඩෝසර් දෙකක් නිකුත් කර ඇත. මෙම ඩෝසර් දිගු කාලයක සිට භාවිත කිරීමක් හෝ අලුත්වැඩියා කිරීමක් කර නොතිබුණි. එම නිසා එම ඩෝසර් යන්ත්‍ර නැවත කාර්යාලයට රැගෙන යාමට කටයුතු කර ඇත. එබැවින් ඉවත් කරන ලද කොටස් නැවත සවි කර ඒවා ආරක්ෂිතව පවතී. | මෙම යන්ත්‍රෝපකරණ ප්‍රයෝජනවත් කාර්යයන්හි යෙදවීමට කටයුතු කලයුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 වන විට අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 19 දෙනෙකු අතිරික්තව සිටි අතර පුරප්පාඩු 58ක් පැවතුණි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් පරිපාලනය විසින් අනුමත සේවක සංඛ්‍යාවට අමතරව නව පත්වීම් සහ ස්ථාන මාරුවීම් මගින් අතිරේක සංවර්ධන නිලධාරීන් 10 දෙනෙකු අප | පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත් අතිරික්ත නිලධාරීන් අවශ්‍ය අමාත්‍යාංශවලට සහ දෙපාර්තමේන්තුවට |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තුවට පත් කර ඇත. අවශ්‍යතාවය අනුව තොරතුරු තාක්ෂණ නිළධාරියෙකුද පත්කර ඇත. රජයේ චක්‍රලේඛවලට අනුව නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අප දෙපාර්තමේන්තුවේ අනියම්/ආදේශක/තාවකාලික සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ලබාදී ඇති අතර මේ සඳහා නැගෙනහිර පළාතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා අනුමත නඩත්තු සේවක සංඛ්‍යාවට ඔවුන් පත් කිරීමට නැගෙනහිර පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අවසර ලබා දී ඇත. කෙසේ වෙතත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට සේවක සංඛ්‍යාව ඇති කරන ලෙස අපි ඉල්ලා සිටිමු. | මාරු කිරීමටත් කටයුතු කළ යුතුයි. |

**1.5.13 ශීර්ෂය - 962 - ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13කට අදාළ රජයේ ඉඩම්වලින් රු.245,513,346ක බදු වසර 01 ත් 16 ත් අතර කාලසීමාව තුළ හිඟ මුදල් ලෙස පැවතුණි. කෙසේ වෙතත්, එම හිඟ මුදල් අයකර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින දක්වාම ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රු. මිලියන 245.51 ක ප්‍රමාණයෙන් වසර 1 සිට 3 දක්වා කාලයට අයත් හිඟ මුදල් ප්‍රමාණය වන රු.මිලියන 19.5 ක මුදල වර්තමාන වර්ෂය තුළ අයකරගත හැකි අතර මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට උපදෙස් යවා ඇත. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී ගනු ලැබූ තීරණය අනුව වසර 3 සිට 16 දක්වා කාලයට අයත් ඉතිරි හිඟ මුදල් රු.මිලියන 225.9 ට අදාල කල්බදු අවලංගු කිරීම සඳහා LCG වෙත යවා ඇත. ඉඩම් ආඥාපනතේ අංක 86 (1) ඡේදය අනුව නොගෙවූ බදු හිඟ මුදල්වලට එරෙහිව නීතිමය පියවර ගැනීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ වගකීම වේ. එසේම අප විසින් බදු හිමියාට ලිපි මගින් දන්වා සිටියේ එම මුදල ගෙවන ලෙසයි. ඒ අනුව 2023.07.18 දින දක්වා රු.7,304,439.60ක් අයකර ගන්නා ලදී. | හිඟ ශේෂය හැකි ඉක්මනින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අයකර ගත යුතුය. |

## 1.5.14 ප්‍රඥප්ති ගිණුම්

**(අ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2015 ජුනි 08 දින පෞද්ගලික බස් රථවල පැමිණීම් සහ පිටත්වීම් අධීක්ෂණය සඳහා රු.මිලියන 1.14 ක් වැයකර GPRS පද්ධතියට සම්බන්ධ කරන ලද අලෙවි යන්ත්‍ර (Point of sales machines) 13 ක් සහ ප්‍රවේශපත්‍ර රෝල් 2,000 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, එය ක්‍රියාත්මක කිරීමට නිසි මෘදුකාංග පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් එම භාණ්ඩ වසර 05කට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි. | අධිකාරියේ අවශ්‍යතාවයට අනුව POS යන්ත්‍රය සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීමට ඔවුන් එකඟ විය. එම යන්ත්‍ර මෘදුකාංග සමග ලබා දීමෙන් පසු අධිකාරිය විසින් ත්‍රිකුණාමලය - මුතූර් මාර්ගයේ 2016 ජුනි මස නියමු ධාවනයක් සිදු කරන ලදී. ඉන් පසු ඔවුන් 2017 ජූනි මස අධිකාරියට නව අනුවාදයක් නිකුත් කර තිබුණි. ඉන්පසුව අප විසින් නැවතත් 2017 ඔක්තෝම්බර් මාසයේදී ත්‍රිකුණාමලය - කන්තලේ පාරේ ක්‍රියාත්මක කරල ලදී. නැවතත් අත්‍යවශ්‍ය වාර්තාකරණ අතුරුමුහුණත ක්‍රියාත්මක නොවන බව අපට පෙනී ගියේය. මෘදුකාංගයේ අවසාන අනුවාදය 2023 මැයි 30 ට පෙර අපගේ සර්වරයට ස්ථාපනය කිරීමට යැවීමට ඔවුන් එකඟ වූ නමුත් සමහර Tomcat සහ Java මෘදුකාංග ගැටළු හේතුවෙන් අප මිලදී ගත් ටෙලිකොම් සර්වරය තහවුරු කරන තෙක් අපි බලා සිටින්නෙමු. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව පද්ධතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) සංචාරක කාර්යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 1985 අංක 15 දරන සංශෝධිත සේවක අර්ථසාධක අරමුදල් පනතට අනුව, ඕනෑම මාසයකට අදාළව අනුමත අර්ථසාධක අරමුදල හෝ අනුමත දායක විශ්‍රාම වැටුප එම අරමුදලට හෝ යෝජනා ක්‍රමයට ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට පෙර ගෙවිය යුතුවේ. එම දායක මුදල් කාලීනව ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ සඳහා අධිභාරයක් ගෙවීමට බැඳී සිටී. ඒ අනුව 2018 දෙසැම්බර් සිට 2021 ජුනි 30 දක්වා කාලය තුළ කොන්ත්‍රාත් පදනම මත කාර්යාංශයට බඳවා ගෙන තිබූ කාර්ය මණ්ඩලය සඳහා ඉහත අරමුදල් වෙත, දායකය ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන්, අධිභාරය සහ හිඟ ගෙවීම් වශයෙන් රු.1,174,556 ක මුදලක් 2022 වර්ෂයේදී ගෙවා තිබුණි. | නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශය ආරම්භ කල මුල් කාලයේ කාර්යංශයට බඳවාගත් තාවකාලික සේවකයින් සම්බන්ධයෙන් මෙම අරමුදල් වලට දායක මුදල් ගෙවී නැත. සේවකයින් තාවකාලික පදනම මත බඳවාගෙන ඇති හෙයින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩලයද අනුමත කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කල පසුව හිඟ මුදල් හා අධිභාර ගෙවා ඇත. වර්තමානයේදී EPF හා ETF ගෙවීම් යථා පරිදි ගෙවෙමින් පවතී. | නොසැලකිලිමත්භාවයෙන් ගෙවූ අධිභාර අදාල නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | නැගෙනහිර පළාතේ සංචාරක කර්මාන්තය වැඩි දියුණු කර ප්‍රවර්ධනය කිරීමේ කටයුතු සඳහා පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.මිලියන 22.2ක් වැය කර තිබුණි. එම කටයුතු 2021 වසරේ ආරම්භ කර තිබුණද 2023 මාර්තු 31 වන විටත් අවසන් කර නොතිබීම හේතුවෙන් නැගෙනහිර පළාතේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කළ හැකි අයුරින් අපේක්ෂිත සංචාරක සේවා කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | මෙම කාර්යය අඛණ්ඩව සිදු කරගෙන යන කාර්යයන් වන බැවින් සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියාත්මක වෙමින් පවතී. | නිශ්චිත කාලය තුළදී මෙම කටයුතු නිම කිරීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |
| **(iii)** | ජැටි ව්‍යාපෘති කටයුතු සඳහා රු.මිලියන 4 ක මුදලක් වෙන් කර තිබූ අතර, එම වැඩ කටයුතු 2021 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද 2023 පෙබරවාරි 28 වන දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ජැටිය අලංකාර කිරීම සහ සංචාරක ආකර්ෂණ ස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා රු.මිලියන 4.0 ක මුදලක් වෙන් කරන ලදී. මේ සඳහා සිවිල් ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, මූල්‍ය අර්බුදය නිසා ප්‍රාග්ධන අරමුදල් නොමැතිකම හේතුවෙන්, ප්‍රධාන ලේකම්වරයා විසින් අංක EP/PL/08/AIP/2022 හා 2022.07.05 දිනැති ඔහුගේ ලිපිය මගින් අතේ ඇති බිල්පත් සහ අඛණ්ඩ වැඩකටයුතුවලට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙසත්, නව වැඩ කිසිවක් ක්‍රියාත්මක නොකරන ලෙසත් උපදෙස් දෙන ලදී. (ඇමුණුම-1) එවැනි තත්ත්වයන් යටතේ මෙය අඛණ්ඩ කාර්යයක් ලෙස ඉදිරියට ගෙන යාමට තීරණය විය. | ව්‍යාපෘතිය සැලසුම් කිරීම ශක්‍යතා අධ්‍යයනයක් තුලින් සිදු කළ යුතුය. |

**(ඇ) පෙරපාසල් අධ්‍යාපන කාර්යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සමඟ යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශය උපචිත පදනම මත සකස් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කාර්යාංශය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.4,606,364ක් වටිනා ස්ථාවර වත්කම්වලින් රු.1,776,835ක වත්කම් පමණක් ක්ෂය කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂයවීම් සහ ක්ෂය සඳහා වෙන්කිරීම් රු.697,532කින් අඩුවෙන් දක්වා තිබුණි. | කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශය පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශන අනුව සකස් කර ඇත. ඉදිරියේදී එම කරුණ නිවැරදි කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශය සත්‍ය සහ සාධාරණ දැක්මක් ඇතිව සකස් කළ යුතුය. |
| **(iii)** | පෙරපාසල් කාර්යාංශයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලයට ලබාදුන් යතුරුපැදි පහක් (05) ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ආපසු භාර නොදී වසරකට වැඩි කාලයක් තිස්සේ භාවිතා කරමින් පැවතුණි. තවද, මෙම යතුරුපැදි 03ක් වාහන ලියාපදිංචි සහතිකයක් නොමැතිව භාවිත කරන බවද විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | මතුව ඇති ගැටලු නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | වත්කම් ප්‍රමාණවත් ආරක්ෂාවක් සහිතව තබා ගත යුතු අතර භාවිතයට ගත හැකි බව සහතික කළ යුතුය. |